OL/2023(2024)/61/S-I, II

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 | S | I, II**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| EMF | |

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

| | |
|---|---|
| **භූගෝල විද්‍යාව** | **I, II** |
| புவியியல் | **I, II** |
| Geography | **I, II** |

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය** - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## භූගෝල විද්‍යාව I

විභාග අංකය: ........................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** පෘථිවියේ මතුපිට භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන .................. ක් පමණ වේ.
(510 / 600 / 750)

**2.** ගැඹුරු සාගර අගාධ බොහොමයක් පිහිටා ඇත්තේ ........................................ සාගරයේ ය.
(ඉන්දියන් / අත්ලන්තික් / පැසිෆික්)

**3.** මෝසම් දේශගුණය ලෝකයේ .................................... දේශගුණික කලාපය තුළ දක්නට ලැබෙන විශේෂ දේශගුණ වර්ගයකි.
(නිවර්තන / සෞම්‍ය / ශීත)

**4.** ශ්‍රී ලංකාවේ පරම ආර්ථික කලාපය නාවික සැතපුම් 24 සිට ............ ක් දක්වා සාගරික ප්‍රදේශයෙහි විහිදේ.
(100 / 200 / 300)

**5.** ශ්‍රී ලංකාවේ බහුලව භාවිත කරන බලශක්ති ප්‍රභවය ............................................. ය.
(පෙට්‍රෝලියම් / ජෛවස්කන්ධ / ජල විදුලිය)

● අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** මහාද්වීපික මායිමේ සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරය මහාද්වීපික බෑවුම ලෙස හැඳින්වේ. **නි / වැ**

**7.** සුපීරියර් විල ලෝකයේ විශාලතම විලයි. **නි / වැ**

**8.** කෘෂිකාර්මික ක්‍රමයක් වුව ද කාර්මික ලක්ෂණ ද දක්නට ලැබීම වතු කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණයකි. **නි / වැ**

**9.** සමනල වැව, වලවේ ගඟ හා සම්බන්ධ ජලාශයකි. **නි / වැ**

**10.** පෘථිවි ප්‍රජාවට බහුලව ස්වාභාවික ආපදා සිදුවන්නේ අවකාශය හා වලාකුළු අතර සිදුවන විදුලි විසර්ජනය නිසා හටගන්නා වායු අකුණු මගිනි. **නි / වැ**

● අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** ලෝකයේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය බහුලව ව්‍යාප්තව පවතින්නේ ........................... කලාපීය ප්‍රදේශවල ය.

**12.** ප්ලාස්ටික්, රසායනික පොහොර සහ තීන්ත වර්ග වැනි ද්‍රව්‍ය ............................. කර්මාන්තය හා සම්බන්ධ අතුරු නිෂ්පාදන වේ.

[දෙවැනි පිටුව බලන්න.

**13.** කහටගහ සහ කොළොන්ගහ යන ප්‍රදේශ .................................. ඛනිජ නිධි සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.

**14.** දියකදුරු, කිරල සහ ගිංපොල් ............................ පරිසර පද්ධතියට අයත් ශාක විශේෂ වේ.


**15.** ශ්‍රී ලංකාවේ අඩුම ජනසංඛ්‍යා ව්‍යාප්තිය දැක්වෙන්නේ ........................... පළාතේ ය.

**16.** භූමියේ පැලුම් ඇතිවීම හා ගිලා බැසීම් හටගැනීම .......................... ආපදාව හටගැනීමේ පූර්ව ලක්ෂණ වේ.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න.

2019 සහ 2020 වර්ෂ දෙක තුළ ශ්‍රී ලංකාවේ තේ අපනයන ප්‍රමාණය හා තේ මිලදී ගත් රටවල් එම ප්‍රස්තාර සටහනෙන් දක්වා ඇත.

**ශ්‍රී ලංකාවේ තේ අපනයන ප්‍රමාණය**




මූලාශ්‍රය - Statistical reports of Ceylon Tea Brokers Association

**17.** 2019 සහ 2020 වර්ෂ දෙකෙහි දී ම ශ්‍රී ලංකාවෙන් තේ කිලෝග්‍රෑම් මිලියන 35 කට වඩා මිලදී ගත් රට කුමක් ද?

...........................................

**18.** 2019 වර්ෂයට වඩා 2020 වර්ෂයේ දී තේ මිලදී ගැනීමේ වැඩිම අඩුවීමක් පෙන්නුම් කරන රට කුමක් ද?

.................................

**19.** සමස්ත තේ අපනයන ප්‍රමාණයේ අඩුවීමක් පෙන්නුම් කරන වර්ෂය කුමක් ද? .....................................

- අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල '**අ**' සහ '**ආ**' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. '**අ**' තීරුවේ ඇති තොරතුරු අනුව '**ආ**' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| 'අ' **භූ ලක්ෂණය** | 'ආ' **පිහිටා ඇති මහාද්වීපය** |
|---|---|
| 1. ඩ්‍රැකන්ස්බර්ග් කඳු | A - උතුරු ඇමෙරිකා |
| 2. මහා බෙදුම් කඳු | B - ඕස්ට්‍රේලියා |
| 3. ඇපලේචියන් කඳු | C - අප්‍රිකා |
| | D - යුරෝපා |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, A (......)

**21.**

| 'අ' **සාගරය** | 'ආ' **දූපත** |
|---|---|
| 1. පැසිෆික් | A - සීෂෙල්ස් |
| 2. අත්ලාන්තික් | B - කැනරි |
| 3. ඉන්දියන් | C - පැපුවා නිව්ගිනියා |
| | D - සයිප්‍රස් |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) C, D, A (......)

**22.**

| 'අ' සුළු අපනයන බෝගය | 'ආ' බහුලව වගා කෙරෙන ප්‍රදේශය |
|---|---|
| 1. කුරුඳු | A - මහනුවර |
| 2. ගම්මිරිස් | B - පුත්තලම |
| 3. කජු | C - කුරුණෑගල |
| | D - ගාල්ල |

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, A, B (……)

**23.**

| 'අ' වනජීවී රක්ෂිත වර්ගය | 'ආ' පිහිටි ප්‍රදේශය |
|---|---|
| 1. දැඩි ස්වාභාවික රක්ෂිත | A - රිටිගල |
| 2. ජාතික උද්‍යාන | B - උඩවලව |
| 3. වන රක්ෂිත | C - කන්නෙලිය |
| | D - වික්ටෝරියා-රන්දෙණිගල |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, A, C (……)

**24.**

| 'අ' භූමිකම්පා ඇතිවන කලාපය | 'ආ' යමහල |
|---|---|
| 1. පැසිෆික් ගිනි වළල්ල | A - විසූවියස් |
| 2. මධ්‍යධරණී-හිමාලයා කඳු | B - කිලිමන්ජාරෝ |
| 3. අප්‍රිකානු සුවිභේද නිම්න | C - හෙක්ලා |
| | D - ක්‍රැකටෝවා |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, A, B (……)

- අංක **25** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** පරිසර පතන ශීඝ්‍රතාව හෙවත් සාමාන්‍ය පතන ශීඝ්‍රතාව හටගන්නා වායුගෝලීය ස්තරය වන්නේ,
(1) පරිවර්තීගෝලයයි. (2) අපරිවර්තීගෝලයයි.
(3) මෙසෝගෝලයයි. (4) තාපගෝලයයි. (……)

**26.** උත්ස්වේදනය මගින් වායුගෝලයට එක්වන්නේ,
(1) භූතලය හා ජලතල මත ඇති ජලයයි. (2) භූගත ජලයයි.
(3) පාංශු ජලයයි. (4) ශාක පත්‍රවල අඩංගු ජලයයි. (……)

**27.** ශිලා ගෝලයේ භූ තැටි අතරින් සුමාත්‍රා හා ජාවා දූපත් පිහිටා ඇත්තේ කුමන භූ තැටියේ ද?
(1) පිලිපීන (2) ඉන්දු-ඕස්ට්‍රේලියානු
(3) යුරේෂියානු (4) පැසිෆික් (……)

**28.** හෙල්මළු ක්‍රමයට වී වගාව බහුලව සිදු කෙරෙන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගම්පහ සහ කෑගල්ල (2) මහනුවර සහ නුවරඑළිය
(3) මාතලේ සහ අම්පාර (4) මොනරාගල සහ මාතර (……)

**29.** ලෝකයේ කපු පිළි නිෂ්පාදනය සඳහා වැදගත්වන රටවල් යුගලයක් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඊජිප්තුව සහ දකුණු අප්‍රිකාව (2) තායිලන්තය සහ බ්‍රසීලය
(3) බංගලාදේශය සහ ඉන්දියාව (4) ඉන්දියාව සහ චීනය (……)

**30.** වනාන්තර වර්ග පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
- ජෛවවිවිධත්වය ඉහළ මට්ටමක පවතී
- පැළෑටි වර්ධනය වේගයෙන් සිදු වේ
- වියන් ස්තර ගණනාවකින් යුක්තය
- ඝන යටිරෝපණයක් ඇත

ඉහත ලක්ෂණ පෙන්වන වනාන්තර වර්ගය කුමක් ද?
(1) නිවර්තන වර්ෂා වනාන්තර (2) සෞම්‍යකලාපික පතනශීල වනාන්තර
(3) නිවර්තන සැවානා වනාන්තර (4) කේතුධර වනාන්තර (……)

**31.** අවසාදිත පාෂාණ පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) හුනුගල්, ජිප්සම්, ගල් අඟුරු (2) නයිස්, ග්‍රැනයිට්, ජිප්සම්
(3) ග්‍රැනයිට්, ගල් අඟුරු, හුනුගල් (4) ගැබ්‍රෝ, කිරිගරුඬ, හුනුගල් (……)

[හතරවැනි පිටුව බලන්න.

**32.** ශ්‍රී ලංකාවේ රතු දුඹුරු පස බහුලව ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කය කුමක් ද?
(1) අම්පාර (2) අනුරාධපුර (3) කළුතර (4) පුත්තලම (……)

**33.** ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පෙට්‍රෝලියම් වැඩි වශයෙන් භාවිතයට ගනු ලබන්නේ කුමන කටයුත්තක් සඳහා ද?
(1) කර්මාන්ත (2) විදුලිය ජනනය
(3) ප්‍රවාහනය (4) ගෘහස්ත කටයුතු (……)

**34.** මධ්‍යම ඕස්ට්‍රේලියාව ජනහීන වීම කෙරෙහි බලපා ඇති භෞතික සාධකය කුමක් ද?
(1) රළු භූ විෂමතාවෙන් යුක්ත වීම (2) උෂ්ණ කාන්තාර ප්‍රදේශයක් වීම
(3) ඝන වනාන්තර ප්‍රදේශයක් වීම (4) ශීත කාන්තාරයක් වීම (……)

**35.** පහත ප්‍රකාශ සලකන්න.
A - බාල වයස් යැපෙන්නන්ගේ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී
B - වියපත් ජනසංඛ්‍යාව වර්ධනය වෙමින් පවතී
C - ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය වැඩිවෙමින් පවතී
D - ශ්‍රම බලකාය ක්‍රමයෙන් ඉහළ යමින් පවතී
ඉහත ප්‍රකාශ අතුරින් ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා ව්‍යුහය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D (……)

**36.** ආපදා අවස්ථාවකදී ඉන් පීඩාවට පත්වූවන්ට තාවකාලික වාසස්ථාන ලබාදීම, ආපදා කළමනාකරණ චක්‍රයෙහි කුමන අවස්ථාවට අයත් වේද?
(1) පෙර සූදානම (2) යථා තත්ත්වයට පත් කිරීම
(3) අවම කිරීම (4) ප්‍රතිචාර දැක්වීම (……)

**37.** දේශගුණික වෙනස්කම් අවම කිරීම සඳහා ක්ලෝරෝ ෆ්ලුවොරෝ කාබන් (CFC) වායු විමෝචන ක්‍රියාකාරකම් නැවැත්වීමට ශ්‍රී ලංකාව ක්‍රියාමාර්ග ගනු ලැබුවේ කුමන සමුළුවෙන් පසුව ද?
(1) රියෝ (2) ස්ටොක්හෝම් (3) කියෝතෝ (4) පැරිස් (……)

- පහත **A, B, C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - 1. සෞඛ්‍ය පහසුකම්
2. ආයු අපේක්ෂාව

**B** - 1. බාල වයස් යැපෙන්නන් සංඛ්‍යාව
2. වියපත් ජන සංඛ්‍යාව

**C** - 1. ස්වාභාවික විපත්
2. දේශගුණික වෙනස්කම්

**D** - 1. පාරිසරික විසංතුලනය
2. තිරසර සංවර්ධනය

**38.** පළමුවැන්නේ වර්ධනය දෙවැන්නේ ද වර්ධනයට හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

**39.** පළමුවැන්න හේතුකොට ගෙන උද්ගතවන ගැටලු අවම කර ගැනීමට දෙවැන්න උපකාරී වේ යැයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

**40.** පළමුවැන්නේ වැඩිවීමට දෙවැන්නේ බලපෑම දැක්වෙන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

✻ ✻

[පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 S I, II**

66268

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

| | |
|---|---|
| **භූගෝල විද්‍යාව** | **I, II** |
| புவியியல் | **I, II** |
| Geography | **I, II** |

## භූගෝල විද්‍යාව II

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි**.

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.

- අංක (i) සිට (iv) තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ - Ⓑ රේඛාවෙන් දක්වා ඇති බෑවුම කුමක් ද?
(ඒකාකාර බෑවුම / උත්තල බෑවුම / අවතල බෑවුම) (ලකුණු 01 යි)

(ii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(ගල් තලාව / ලඳු කැලෑව / වනාන්තරය) (ලකුණු 01 යි)

(iii) Ⓓ අක්ෂරයෙන් දැක්වෙන අගයෙන් අදහස් වන්නේ කුමක් ද?
(දේශාංශ රේඛා / අක්ෂාංශ රේඛා / ඛණ්ඩාංක රේඛා) (ලකුණු 01 යි)

(iv) සිතියම් ප්‍රදේශයේ නිරිත දිග පිහිටි ප්‍රධාන ගංගාව ඔස්සේ විහිදෙන පරිපාලන මායිම කුමක් ද?
(දිස්ත්‍රික් / ග්‍රාම නිලධාරී කොට්ඨාස / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) (ලකුණු 01 යි)

(v) ඔබ සිතියම් ප්‍රදේශයේ දකුණු මායිමේ සිට උතුරු මායිම දක්වා දුම්රියෙන් ගමන් කරන්නේ නම් ඔබ පසුකරන ප්‍රදේශයේ වැඩි වශයෙන් ම ව්‍යාප්ත වී ඇති ව්‍යාපාරික බෝගය කුමක් ද? (ලකුණු 01 යි)

(vi) Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති චතුරස්‍රාකාර ප්‍රදේශය තුළ සම්මත සංකේත මගින් නිරූපණය කෙරෙන පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (vii) සහ (viii) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් '**නි**' යන්න ද වැරදි නම් '**වැ**' යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(vii) සිතියම් ප්‍රදේශයේ පිහිටා ඇති හෙල්වැටි වයඹ-ගිනිකොණ දිශානුගතව විහිදේ. (ලකුණු 01 යි)

(viii) සිතියම් ප්‍රදේශය තෙත් කලාපයට අයත් බවට සාධක ඇත. (ලකුණු 01 යි)

(ix) Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති කොටු කළ ප්‍රදේශයෙහි විශාලත්වය වර්ග කිලෝමීටර කීය ද? (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක **9**) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) ඇල්ප්ස් කඳුවැටිය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) පරානා පැරගුවේ ගංගාව - Ⓓ, Ⓔ, Ⓕ

(iii) ග්‍රේට්ස්ලේව් විල - Ⓟ, Ⓠ, Ⓡ

(iv) තායිවාන් දූපත - Ⓢ, Ⓣ, Ⓤ

(v) පර්ත් නගරය - Ⓧ, Ⓨ, Ⓩ

(ලකුණු 05 යි)

[හයවැනි පිටුව බලන්න.

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක **9**) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) මහනුවර දිස්ත්‍රික්කය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) අම්බලන්තොට වී පර්යේෂණායතනය - Ⓓ, Ⓔ, Ⓕ

(iii) කන්කසන්තුරෙයි වරාය - Ⓙ, Ⓚ, Ⓛ

(iv) සිංහරාජ වනාන්තරය - Ⓜ, Ⓝ, Ⓞ

(v) සේනානායක සමුද්‍රය - Ⓦ, Ⓧ, Ⓨ (ලකුණු 05 යි)

## II කොටස

**2.** (i) පාෂාණවල ඝනත්වය, සංයුතිය හා පිහිටීම අනුව පෘථිවි කබොල බෙදෙන කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පෘථිවි ප්‍රාවරණයෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පෘථිවි කබොල ප්‍රයෝජනවත් වන ආකාරය පහත ශීර්ෂ යටතේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(a) කෘෂිකර්මය

(b) කර්මාන්ත

(c) බලශක්තිය (ලකුණු 05 යි)

**3.** (i) පහත දැක්වෙන එක් එක් බෝගය වගා කිරීම සඳහා යෝග්‍ය පස් වර්ගය ලියා දක්වන්න.

(a) තිරිඟු

(b) වී (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙහි වී වගාව සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිත පහත සඳහන් ක්‍රියාකාරකම් හේතුවෙන් හටගන්නා **අහිතකර** ප්‍රතිඵල **එක බැගින්** ලියන්න.

A - කෘත්‍රිම පොහොර භාවිතය

B - කෘමිනාශක හා වල්නාශක භාවිතය

C - නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය

(b) ඔබ ඉහත (iii) (a) හි සඳහන් කළ **එක්** අහිතකර ප්‍රතිඵලයක් තෝරාගෙන එහි බලපෑම අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) කාර්මික නිෂ්පාදනයක් ලෙස යකඩ හා වානේ වැදගත්වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන රටවල් තුනෙහි යකඩ හා වානේ නිෂ්පාදනය කෙරෙන මධ්‍යස්ථාන **එක බැගින්** නම් කරන්න.

(a) ඉන්දියාව

(b) චීනය


(c) ඇමෙරිකා එක්සත් ජනපදය (ලකුණු 03 යි)

(iii) ලෝකයේ රටවල් අතර සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව වැදගත්වීමට හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

5. (i) ලෝකයේ අධිකතම ජනසංඛ්‍යාවක් වාසය කරන රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත දක්වා ඇති සිතියම් කොටසෙහි ජනහීන කලාප තුනක් Ⓐ , Ⓑ හා Ⓒ යනුවෙන් දක්වා ඇත.

ඒ එක් එක් කලාපය ජනහීන වීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන හේතුව කුමක්දැයි ලියා දක්වන්න. (ලකුණු 03 යි)




(iii) ශ්‍රී ලංකාවේ අසම ජන ව්‍යාප්තියක් ඇතිවීමට ඉවහල් වී ඇති හේතු **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

6. (i) පහත (a) සහ (b) සඳහා ගැළපෙන ස්වාභාවික සම්පත් **එක බැගින්** නම් කරන්න.

(a) ආයාසයෙන් ලබාගන්නා සම්පත්

(b) නිරායාසයෙන් ලැබෙන සම්පත් (ලකුණු 02 යි)

(ii) ආග්නේය පාෂාණවලින් ලබා ගත හැකි ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ වන ජීවීන් මුහුණපාන ගැටලු **තුනක්** නම් කර ඒවා විසඳා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

7. (i) මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉවහල්වන ආකාරය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(a) අධ්‍යාපනය

(b) සෞඛ්‍යය

(c) බැංකු හා මූල්‍ය ගනුදෙනු (ලකුණු 05 යි)

8. (i) ලෝකයේ ලැව්ගිනි බහුලව හටගන්නා රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලැව්ගිනි හටගැනීමට බලපාන ස්වාභාවික හේතු **දෙකක්** ද මානුෂ හේතු **එකක්** ද වෙන් වෙන් ව ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) දේශගුණික වෙනස්කම් අවම කර ගැනීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

විභාග අංකය / சுட்டெண் / Index Number ..............................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

| පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only |
| --- |

**1.** (අ) /(அ) /(a)

(i) ..............................

(ii) ..............................

(iii) ..............................

(iv) ..............................

(v) ..............................

(vi) ● ..............................

● ..............................


(vii) ..............................

(viii) ..............................

(ix) ..............................


10

(ආ) /(ஆ) /(b)




(i) (ii) (iii) (iv) (v) 5

(ඉ) /(இ) /(c)




(i) (ii) (iii) (iv) (v) 5

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும். For Examiner's Use Only.

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඉ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$


සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

## භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II




SCALE : 1 : 50,000


සියලු ම හිමිකම් ඇවිරිණි. | රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 61 - භූගෝල විද්‍යාව

ලකුණු දීමේ පටිපාටිය





මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

## 61 - භූගෝල විද්‍යාව I, II

## අවසාන ලකුණු ගණනය කිරීම

**I පත්‍රය**

ප්‍රශ්න අංක 01 - 40 (01 X 40)          ලකුණු 40

**II පත්‍රය**

I කොටස

1. ප්‍රශ්නය          ලකුණු 20

II කොටස

| | | |
|---|---|---|
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04කට ලකුණු 40 |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 8. ප්‍රශ්නය | ලකුණු 10 | |

I පත්‍රයට          ලකුණු 40

II පත්‍රයට          ලකුණු 60

**අවසාන ලකුණු 100**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................ ✓ △ $\frac{4}{5}$

(ii) ........................................ ✓ △ $\frac{3}{5}$

(iii) ........................................ ✓ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ → එකතුව □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- (I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

## භූගෝල විද්‍යාව I වන පත්‍රය
## ඉගෙනුම් පල

1. පෘථිවි ගෝලයේ මතුපිට ඇති භෞතික භූ දර්ශනය පැහැදිලි කරයි.
2. භෞතික භූ දර්ශනයට අයත් වන ප්‍රධාන භෞතික ලක්ෂණ නම් කරයි.
3. ශිලා ගෝලයේ මූලික පාෂාණ සංයුතිය පැහැදිළි කරයි.
4. පෘථිවි ජල ගෝලයේ ජලය ශිලා ගෝලය වායුගෝලය හා ජෛව ගෝලය අතර හුවමාරු වීමේ ක්‍රියාවලිය විස්තර කරයි. (ජල චක්‍රය)
5. වායුගෝලීය ස්තරවල ස්වාභාවය පැහැදිලි කරයි.
6. ශ්‍රී ලංකාවේ වී වගාවට සුවිශේෂී වූ ලක්ෂණ පැහැදිලි කරයි.
7. ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ලක්ෂණ පැහැදිලි කරයි.
8. ශ්‍රී ලංකාවේ බහුලව ප්‍රයෝජනයට ගන්නා ඛනිජ සම්පත් නම් කරයි.
9. ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ සංඛ්‍යාත්මකව විස්තර කරයි.
10. මානුෂ සම්පත් සංවර්ධනයෙහි වැදගත්කම පැහැදිලි කරයි.
11. ප්‍රස්තාර කියවා ඒ ඇසුරින් තොරතුරු පැහැදිලි කරයි.

OL/2023(2024)/61/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 | S | I, II**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| EMF | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## භූගෝල විද්‍යාව I

විභාග අංකය: ..........................

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** පෘථිවියේ මතුපිට භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන ......510...... ක් පමණ වේ.
(510 / 600 / 750)

**2.** ගැඹුරු සාගර අගාධ බොහොමයක් පිහිටා ඇත්තේ ......පැසිෆික්...... සාගරයේ ය.
(ඉන්දියන් / අත්ලාන්තික් / පැසිෆික්)

**3.** මෝසම් දේශගුණය ලෝකයේ ......නිවර්තන...... දේශගුණික කලාපය තුළ දක්නට ලැබෙන විශේෂ දේශගුණ වර්ගයකි.
(නිවර්තන / සෞම්‍ය / ශීත)

**4.** ශ්‍රී ලංකාවේ පරම ආර්ථික කලාපය නාවික සැතපුම් 24 සිට ......200...... ක් දක්වා සාගරික ප්‍රදේශයෙහි විහිදේ.
(100 / 200 / 300)

**5.** ශ්‍රී ලංකාවේ බහුලව භාවිත කරන බලශක්ති ප්‍රභවය ......ජෛවස්කන්ධ...... ය.
(පෙට්‍රෝලියම් / ජෛවස්කන්ධ / ජල විදුලිය)

● අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් **'නි'** යන්න වටා ද වැරදි නම් **'වැ'** යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** මහාද්වීපික මායිමේ සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරය මහාද්වීපික බෑවුම ලෙස හැඳින්වේ. නි / (වැ)

**7.** සුපීරියර් විල ලෝකයේ විශාලතම විලයි. (නි) / වැ

**8.** කෘෂිකාර්මික ක්‍රමයක් වුව ද කාර්මික ලක්ෂණ ද දක්නට ලැබීම වතු කෘෂිකර්මයේ විශේෂ ලක්ෂණයකි. (නි) / වැ

**9.** සමනල වැව, වලවේ ගඟ හා සම්බන්ධ ජලාශයකි. (නි) / වැ

**10.** පෘථිවි ප්‍රජාවට බහුලව ස්වාභාවික ආපදා සිදුවන්නේ අවකාශය හා වලාකුළු අතර සිදුවන විදුලි විසර්ජනය නිසා හටගන්නා වායු අකුණු මගිනි. නි / (වැ)

● අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්, සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** ලෝකයේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය බහුලව ව්‍යාප්තව පවතින්නේ ......සෞම්‍ය...... කලාපීය ප්‍රදේශවල ය.

**12.** ප්ලාස්ටික්, රසායනික පොහොර සහ තීන්ත වර්ග වැනි ද්‍රව්‍ය ......පෙට්‍රෝරසායන...... කර්මාන්තය හා සම්බන්ධ අතුරු නිෂ්පාදන වේ.

/දෙවැනි පිටුව බලන්න.

13. කහටගහ සහ කොළොන්ගහ යන ප්‍රදේශ ........මිනිරන්........ ඛනිජ නිධි සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.


14. දියකදුරු, කිරල සහ හිංපොල් ....කඩොලාන පරිසර පද්ධතියට අයත් ශාක විශේෂ වේ.

15. ශ්‍රී ලංකාවේ අඩුම ජනසංඛ්‍යා ව්‍යාප්තිය දැක්වෙන්නේ ....උතුරු......... පළාතේ ය.

16. භූමියේ පැලුම් ඇතිවීම හා ගිලා බැසීම හටගැනීම ..නායයෑම්....... ආපදාව හටගැනීමේ පූර්ව ලක්ෂණ වේ.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කර ගන්න. 2019 සහ 2020 වර්ෂ දෙක තුළ ශ්‍රී ලංකාවේ තේ අපනයන ප්‍රමාණය හා තේ මිලදී ගත් රටවල් එම ප්‍රස්තාර සටහනෙන් දක්වා ඇත.

**ශ්‍රී ලංකාවේ තේ අපනයන ප්‍රමාණය**




මූලාශ්‍රය - Statistical reports of Ceylon Tea Brokers Association

17. 2019 සහ 2020 වර්ෂ දෙකෙහි දී ම ශ්‍රී ලංකාවෙන් තේ කිලෝග්‍රෑම් මිලියන 35 කට වඩා මිලදී ගත් රට කුමක් ද?
..............තුර්කිය.........

18. 2019 වර්ෂයට වඩා 2020 වර්ෂයේ දී තේ මිලදී ගැනීමේ වැඩිම අඩුවීමක් පෙන්නුම් කරන රට කුමක් ද?
.......ඉරානය......

19. සමස්ත තේ අපනයන ප්‍රමාණයේ අඩුවීමක් පෙන්නුම් කරන වර්ෂය කුමක් ද? .......2020.................

- අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20.

| 'අ' භූ ලක්ෂණය | 'ආ' පිහිටා ඇති මහාද්වීපය |
|---|---|
| 1. ඩ්‍රැකන්ස්බර්ග් කඳු | A - උතුරු ඇමෙරිකා |
| 2. මහා බෙදුම් කඳු | B - ඕස්ට්‍රේලියා |
| 3. ඇපලේචියන් කඳු | C - අප්‍රිකා |
| | D - යුරෝපා |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, B, A (..3..)

21.

| 'අ' සාගරය | 'ආ' දූපත |
|---|---|
| 1. පැසිෆික් | A - සීෂෙල්ස් |
| 2. අත්ලාන්තික් | B - කැනරි |
| 3. ඉන්දියන් | C - පැපුවා නිව්ගිනියා |
| | D - සයිප්‍රස් |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) C, D, A (..3..)

[තුන්වැනි පිටුව බලන්න.

**22.**

| 'අ' සුළු අපනයන බෝගය | 'ආ' බහුලව වගා කෙරෙන ප්‍රදේශය |
|---|---|
| 1. කුරුඳු | A - මහනුවර |
| 2. ගම්මිරිස් | B - පුත්තලම |
| 3. කජු | C - කුරුණෑගල |
| | D - ගාල්ල |

(1) A, B, C (2) B, C, D (3) C, D, A (4) D, A, B (..4..)

**23.**

| 'අ' වනජීවී රක්ෂිත වර්ගය | 'ආ' පිහිටි ප්‍රදේශය |
|---|---|
| 1. දැඩි ස්වාභාවික රක්ෂිත | A - රිටිගල |
| 2. ජාතික උද්‍යාන | B - උඩවලව |
| 3. වන රක්ෂිත | C - කන්නෙලිය |
| | D - වික්ටෝරියා-රන්දෙණිගල |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, A, C (..1..)

**24.**

| 'අ' භූමිකම්පා ඇතිවන කලාපය | 'ආ' යමහල |
|---|---|
| 1. පැසිෆික් ගිනි වළල්ල | A - විසූවියස් |
| 2. මධ්‍යධරණී-හිමාලයා කඳු | B - කිලිමන්ජාරෝ |
| 3. අප්‍රිකානු සුවිභේද නිම්න | C - හෙක්ලා |
| | D - ක්‍රැකටෝවා |

(1) A, B, C (2) B, C, D (3) C, B, A (4) D, A, B (..4..)

- අංක **25** සිට **37** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත්** ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** පරිසර පතන ශීඝ්‍රතාව හෙවත් සාමාන්‍ය පතන ශීඝ්‍රතාව හටගන්නා වායුගෝලීය ස්තරය වන්නේ,
(1) පරිවර්තීගෝලයයි. (2) අපරිවර්තීගෝලයයි.
(3) මෙසෝගෝලයයි. (4) තාපගෝලයයි. (..1..)

**26.** උත්ස්වේදනය මගින් වායුගෝලයට එක්වන්නේ,
(1) භූතලය හා ජලතල මත ඇති ජලයයි. (2) භූගත ජලයයි.
(3) පාංශු ජලයයි. (4) ශාක පත්‍රවල අඩංගු ජලයයි. (..4..)

**27.** ශිලා ගෝලයේ භූ තැටි අතරින් සුමාත්‍රා හා ජාවා දූපත් පිහිටා ඇත්තේ කුමන භූ තැටියේ ද?
(1) පිලිපීන (2) ඉන්දු-ඕස්ට්‍රේලියානු
(3) යුරේෂියානු (4) පැසිෆික් (..3..)

**28.** හෙල්මළු ක්‍රමයට වී වගාව බහුලව සිදු කෙරෙන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගම්පහ සහ කෑගල්ල (2) මහනුවර සහ නුවරඑළිය
(3) මාතලේ සහ අම්පාර (4) මොණරාගල සහ මාතර (..2..)

**29.** ලෝකයේ කපු පිළි නිෂ්පාදනය සඳහා වැදගත්වන රටවල් යුගලයක් දැක්වෙන වරණය තෝරන්න.
(1) ඊජිප්තුව සහ දකුණු අප්‍රිකාව (2) තායිලන්තය සහ බ්‍රසීලය
(3) බංගලාදේශය සහ ඉන්දියාව (4) ඉන්දියාව සහ චීනය (..4..)

**30.** වනාන්තර වර්ග පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
- ජෛවවිවිධත්වය ඉහළ මට්ටමක පවතී
- පැළෑටි වර්ධනය වේගයෙන් සිදු වේ
- වියන් ස්තර ගණනාවකින් යුක්තය
- ඝන යටිරෝපණයක් ඇත

ඉහත ලක්ෂණ පෙන්වන වනාන්තර වර්ගය කුමක් ද?
(1) නිවර්තන වර්ෂා වනාන්තර (2) සෞම්‍යකලාපික පතනශීල වනාන්තර
(3) නිවර්තන සැවානා වනාන්තර (4) කේතුධර වනාන්තර (..1..)

**31.** අවසාදිත පාෂාණ පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) හුණුගල්, ජිප්සම්, ගල් අඟුරු (2) නයිස්, ග්‍රැනයිට්, ජිප්සම්
(3) ග්‍රැනයිට්, ගල් අඟුරු, හුණුගල් (4) ගැබ්‍රෝ, කිරිගරුඬ, හුණුගල් (..1..)

[හතරවැනි පිටුව බලන්න.

**32.** ශ්‍රී ලංකාවේ රතු දුඹුරු පස බහුලව ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කය කුමක් ද?
(1) අම්පාර (2) අනුරාධපුර (3) කළුතර (4) පුත්තලම (..2..)

**33.** ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පෙට්‍රෝලියම් වැඩි වශයෙන් භාවිතයට ගනු ලබන්නේ කුමන කටයුත්තක් සඳහා ද?
(1) කර්මාන්ත (2) විදුලිය ජනනය
(3) ප්‍රවාහනය (4) ගෘහස්ථ කටයුතු (..3..)

**34.** මධ්‍යම ඕස්ට්‍රේලියාව ජනහීන වීම කෙරෙහි බලපා ඇති භෞතික සාධකය කුමක් ද?
(1) රළු හා විෂමතාවෙන් යුක්ත වීම (2) උෂ්ණ කාන්තාර ප්‍රදේශයක් වීම
(3) ඝන වනාන්තර ප්‍රදේශයක් වීම (4) ශීත කාන්තාරයක් වීම (..2..)

**35.** පහත ප්‍රකාශ සලකන්න.
A - බාල වයස් යැපෙන්නන්ගේ සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී
B - වියපත් ජනසංඛ්‍යාව වර්ධනය වෙමින් පවතී
C - ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය වැඩිවෙමින් පවතී
D - ශ්‍රම බලකාය ක්‍රමයෙන් ඉහළ යමින් පවතී
ඉහත ප්‍රකාශ අතුරින් ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා ව්‍යුහය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ දෙක පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D (..3..)

**36.** ආපදා අවස්ථාවකදී ඉන් පීඩාවට පත්වූවන්ට තාවකාලික වාසස්ථාන ලබාදීම, ආපදා කළමනාකරණ චක්‍රයෙහි කුමන අවස්ථාවට අයත් වේද?
(1) පෙර සූදානම (2) යථා තත්ත්වයට පත් කිරීම
(3) අවම කිරීම (4) ප්‍රතිචාර දැක්වීම (..4..)

**37.** දේශගුණික වෙනස්කම් අවම කිරීම සඳහා ක්ලෝරෝ ෆ්ලුවොරෝ කාබන් (CFC) වායු විමෝචන ක්‍රියාකාරකම් නැවැත්වීමට ශ්‍රී ලංකාව ක්‍රියාමාර්ග ගනු ලැබුවේ කුමන සමුළුවෙන් පසුව ද?
(1) රියෝ (2) ස්ටොක්හෝම් (3) කියෝතෝ (4) පැරිස් (..1..)

● පහත A, B, C සහ D මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. සෞඛ්‍ය පහසුකම්
2. ආයු අපේක්ෂාව

B - 1. බාල වයස් යැපෙන්නන් සංඛ්‍යාව
2. වියපත් ජන සංඛ්‍යාව

C - 1. ස්වාභාවික විපත්
2. දේශගුණික වෙනස්කම්

D - 1. පාරිසරික විසංතුලනය
2. තිරසර සංවර්ධනය

**38.** පළමුවැන්නේ වර්ධනය දෙවැන්නේ ද වර්ධනයට හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..1..)

**39.** පළමුවැන්න හේතුකොට ගෙන උද්ගතවන ගැටලු අවම කර ගැනීමට දෙවැන්න උපකාරී වේ යැයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..4..)

**40.** පළමුවැන්නේ වැඩිවීමට දෙවැන්නේ බලපෑම දැක්වෙන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (..3..)

❊ ❊

/පස්වැනි පිටුව බලන්න.

# II කොටස

01. ඉගෙනුම් පල :

1. 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන ප්‍රධාන භෞතික ලක්ෂණ හඳුනාගෙන නම් කරයි.

2. 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල සම්මත සලකුණු හා සංකේත මගින් දක්වා ඇති සංස්කෘතික ලක්ෂණ නම් කරයි.

3. 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරයි.

4. ලෝකයේ සහ ශ්‍රී ලංකාවේ ආකෘති සිතියම්වල ලකුණු කර දක්වා ඇති ස්ථානවල නිවැරදි පිහිටීම නම් කරයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

## භූගෝල විද්‍යාව II

※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
※ I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
※ II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
※ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 8) යොදා ගන්න.

● අංක (i) සිට (iv) තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ - Ⓑ රේඛාවෙන් දක්වා ඇති බෑවුම කුමක් ද?
(ඒකාකාර බෑවුම / උත්තල බෑවුම / අවතල බෑවුම) (ලකුණු 01 යි)

(ii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(ගල් තලාව / ලඳු කැලෑව / වනාන්තරය) (ලකුණු 01 යි)

(iii) Ⓓ අක්ෂරයෙන් දැක්වෙන අගයෙන් අදහස් වන්නේ කුමක් ද?
(දේශාංශ රේඛා / අක්ෂාංශ රේඛා / ඛණ්ඩාංක රේඛා) (ලකුණු 01 යි)

(iv) සිතියම් ප්‍රදේශයේ නිරිත දිග පිහිටි ප්‍රධාන ගංගාව ඔස්සේ විහිදෙන පරිපාලන මායිම කුමක් ද?
(දිස්ත්‍රික් / ග්‍රාම නිලධාරි කොට්ඨාස / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) (ලකුණු 01 යි)

(v) ඔබ සිතියම් ප්‍රදේශයේ දකුණු මායිමේ සිට උතුරු මායිම දක්වා දුම්රියෙන් ගමන් කරන්නේ නම් ඔබ පසුකරන ප්‍රදේශයේ වැඩි වශයෙන් ම ව්‍යාප්ත වී ඇති ව්‍යාපාරික බෝගය කුමක් ද? (ලකුණු 01 යි)

(vi) Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති චතුරස්‍රාකාර ප්‍රදේශය තුළ සම්මත සංකේත මගින් නිරූපණය කෙරෙන පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

● සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (vii) සහ (viii) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා ඒවා නිවැරදි නම් '**නි**' යන්න ද වැරදි නම් '**වැ**' යන්න ද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(vii) සිතියම් ප්‍රදේශයේ පිහිටා ඇති හෙල්වැටි වයඹ-ගිණිකොණ දිශානුගතව විහිදේ. (ලකුණු 01 යි)
(viii) සිතියම් ප්‍රදේශය තෙත් කලාපයට අයත් බවට සාධක ඇත. (ලකුණු 01 යි)

(ix) Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති කොටු කළ ප්‍රදේශයෙහි විශාලත්වය වර්ග කිලෝමීටර කීය ද? (ලකුණු 01 යි)


සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 | II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

## භූගෝල විද්‍යාව II / புவியியல் II / Geography II




SCALE : 1:50,000

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

විභාග අංකය / சுட்டெண் / Index Number ..............................

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
**Geography II**

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only

1. (අ) /(அ) /(a)

(i) අවතල බෑවුම

(ii) ගල්තලාව

(iii) බණ්ඩාකන

(iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

(v) පොල්

(vi) • පාසල / රෝහල
(මින් දෙකක් සඳහන් කිරීම)
• තැපැල් කාර්යාලය / සංචාරක බංගලාව

(vii) තේ

(viii) වැ

(ix) එකයි (1) (1km)

10

[නවවැනි පිටුව බලන්න

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) ඇල්ප්ස් කඳුවැටිය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) පරානා පැරගුවේ ගංගාව - Ⓓ, Ⓔ, Ⓕ

(iii) ග්‍රේට්ස්ලේව් විල - Ⓟ, Ⓠ, Ⓡ

(iv) තායිවාන් දූපත - Ⓢ, Ⓣ, Ⓤ

(v) පර්ත් නගරය - Ⓧ, Ⓨ, Ⓩ

(ලකුණු 05 යි)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව ඇති කොටු (පිටු අංක 9) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) මහනුවර දිස්ත්‍රික්කය - Ⓐ, Ⓑ, Ⓒ

(ii) අම්බලන්තොට වී පර්යේෂණායතනය - Ⓓ, Ⓔ, Ⓕ


(iii) කන්කසන්තුරෙයි වරාය - Ⓙ, Ⓚ, Ⓛ

(iv) සිංහරාජ වනාන්තරය - Ⓜ, Ⓝ, Ⓞ

(v) සේනානායක සමුද්‍රය - Ⓦ, Ⓧ, Ⓨ

(ලකුණු 05 යි)


(ආ) /(ஆ) /(b)




(i) B
(ii) E
(iii) P
(iv) T
(v) X

/5

(ඇ) /(இ) /(c)




(i) A
(ii) D
(iii) K
(iv) N
(v) Y

/5

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும். For Examiner's Use Only.

1. (අ) (அ) (a) —/10 (ආ) (ஆ) (b) —/5 (ඇ) (இ) (c) —/5 = —/20

**02. ඉගෙනුම් පල :**

**1. පෘථිවියේ සංයුතිය පැහැදිලි කරයි.**

**2. මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පෘථිවි කබොල ප්‍රයෝජනවත් වන ආකාරය විමර්ශනය කරයි.**

**II කොටස**

2. (i) පාෂාණවල ඝනත්වය, සංයුතිය හා පිහිටීම අනුව පෘථිවි කබොල බෙදෙන කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පෘථිවි ප්‍රාවරණයෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පෘථිවි කබොල ප්‍රයෝජනවත් වන ආකාරය පහත ශීර්ෂ යටතේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(a) කෘෂිකර්මය

(b) කර්මාන්ත

(c) බලශක්තිය (ලකුණු 05 යි)

(02)

I. පාෂාණවල ඝනත්වය සංයුතිය හා පිහිටීම අනුව පෘථිවි කබොල බෙදෙන කොටස් දෙක නම් කරන්න.

- මහද්වීපික කබොල
- සාගරික කබොල

**(ලකුණු 1+1= 02)**

II. පෘථිවි ප්‍රාවරණයෙහි කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

- කබොල හා හරය අතර පිහිටි ස්ථරයයි.
- පෘථිවිය මතුපිට සිට 2900km දක්වා ගැඹුරට විහිදේ.
- පෘථිවි ස්කන්ධයෙන් 2/3 ක් පමණ මෙයට අයත් වේ.
- ප්‍රාවරණයේ ඉහළ කොටස ඔලිවීන් සහ සිලිකේට්වලින් සමන්විතය.
- ප්‍රාවරණයේ පහළ කොටස මැග්නීසියම් හා සිලිකේට්වලින් සමන්විත වේ.
- පාෂාණ හා රසායනික සංයුතිය අනුව ප්‍රාවරණය ඉහළ ප්‍රාවරණය හා පහළ ප්‍රාවරණය ලෙස කොටස් දෙකකට බෙදේ.

**(මෙවැනි ලක්ෂණ තුනක් සඳහන් කිරීමට 1x 3 = 03)**

iii

**(a)** කෘෂිකර්මය
**(b)** කර්මාන්ත
**(c)** බලශක්තිය

**(a)** කෘෂිකර්මය

- මිනිසාට අවශ්‍ය ආහාර පාන සැපයීම සඳහා බෝග වගාවට උපකාරී වීම
- පස : විවිධ බෝගවගාවන් සඳහා විවිධ පස් වර්ගවලින් සමන්විත වීම
  නිද : දියලු පස වී
  වර්නසම් පස - තිරිඟු
  කබොක් මිශ්‍ර රතු පස - රබර් ආදී වශයෙන්
- ජලය - කෘෂිකාර්මික කටයුතු සඳහා
- භූතල ජලය - භූගත ජලය

**(b)** කර්මාන්ත

- කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය
- ඛනිජ - ලෝහමය - යකඩ, තඹ, ඇලුමිනියම් හා රන් වැනි
- අලෝහමය - වැලි, මිනිරන්, පොස්පේට්, මැණික් වැනි
- පාෂාණ - ආග්නේය, අවසාදිත, විපරීත වැනි

**(c)** බලශක්තිය

- ගල් අඟුරු
- පෙට්‍රෝලියම්
- ස්වභාවික වායු
- ජලය

නිදසුන් තුනකට ලකුණු 03
විස්තරයට ලකුණු 02
05

**03. ඉගෙනුම් පල :**

**1. විවිධ බෝග වගාවන් සහ පස් වර්ග අතර සබඳතාව පැහැදිලි කරයි.**

**2. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙහි වී වගාවේ සුවිශේෂතා විස්තර කරයි.**

**3. නූතන කෘෂිකාර්මික ක්‍රම ආශ්‍රිත අහිතකර ප්‍රතිඵල විමර්ශනය කරයි.**

**3.** (i) පහත දැක්වෙන එක් එක් බෝගය වගා කිරීම සඳහා යෝග්‍ය පස් වර්ගය ලියා දක්වන්න.
(a) තිරිඟු
(b) වී (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙහි වී වගාව සම්බන්ධයෙන් කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිත පහත සඳහන් ක්‍රියාකාරකම් හේතුවෙන් හටගන්නා **අහිතකර** ප්‍රතිඵල **එක බැගින්** ලියන්න.
A - කෘත්‍රිම පොහොර භාවිතය
B - කෘමිනාශක හා වල්නාශක භාවිතය
C - නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය

(b) ඔබ ඉහත (iii) (a) හි සඳහන් කළ **එක්** අහිතකර ප්‍රතිඵලයක් තෝරාගෙන එහි බලපෑම අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.(ලකුණු 05 යි)

(03)

I. (a) තිරිඟු - චර්නසම් පස

(b) වී - දියළු පස

**(ලකුණු 1+1= 02)**

II.

- ගංගා මිටියාවත් හා පහත් ප්‍රදේශවල වී වගා කෙරේ.
- ප්‍රධාන වශයෙන් වර්ෂා ජලයෙන් වගා කෙරේ
- අස්වනු ප්‍රමාණය වියළි කලාපයට සාපේක්ෂව අඩුය.
- කුඩා බිම් කට්ටිවල වගා කෙරේ.
- ජල ගැලීම් නිසා බොහෝ විට වගා හානි සිදු වේ.

**මෙවැනි ලක්ෂණ තුනක් සඳහන් කිරීමට**
**( ලකුණු 1 x 3 = 03**

III.

**a.** (A) කෘත්‍රිම පොහොර භාවිතය

- පසේ සාරවත් බව විනාශ වීම
- පාංශු ජීවීන් විනාශ වීම
- පසෙහි ලවනතාව වැඩිවීම
- වියදම් අධික වීම
- විදේශ විනිමය වැයවීම

**මෙවැනි එක් අහිතකර ප්‍රතිඵලයක් සඳහන් කිරීම**

(B) කෘමිනාශක වල්නාශක භාවිතය

- වායු දූෂණය
- පාංශු ජීවීන් විනාශ වීම හා පසෙහි ජීවත්වන පණුවන් විනාශවීම
- ජලදූෂණය
- මිනිස් සිරුරට හානිදායක වීම
- අධික වියදම

**මෙවැනි අහිතකර ප්‍රතිඵලයක් සඳහන් කිරීම**

(C) නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතය

- පාංශු ස්තරවලට හානි සිදුවීම
- පරිසර දූෂණය
- සැඟවුණු අස්වැන්න විනාශ වීම
- වියදම් අධික වීම
- රැකියා වියුක්තිය
- කුඩා බිම් කොටස්වල භාවිත කිරීමේ දුෂ්කරතාව
- හෙල්මලු වගා ප්‍රදේශවල භාවිතා කළ නොහැකි වීම

**මෙවැනි අහිතකර ප්‍රතිඵලයක් සඳහන් කිරීම**

**b.**

ඓන්ද්‍රිය පොහොර භාවිතය
දේශීය කෘමිනාශක හා වල්නාශක ක්‍රම භාවිතය
හැකි සෑම අවස්ථාවක දී ම මිනිස් ශ්‍රමය යොදා ගැනීම
පේළියට වැපිරීමේ ක්‍රම භාවිතය

**මෙවැනි ක්‍රියාමාර්ගයක් ඇසුරින් පැහැදිලි කිරීම**
**අහිතකර ප්‍රතිඵල 03 නම් කිරීමට ලකුණු 03**
**බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග විස්තරයට 02**
**05**

**04. ඉගෙනුම් පල :**

**1. යකඩ හා වානේ කර්මාන්තය වැදගත් වීමට හේතු පරීක්ෂා කරයි.**

**2. යකඩ හා වානේ කර්මාන්තයේ ලෝක ව්‍යාප්තිය හඳුනාගෙන විස්තර කරයි.**

**3. සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ වැදගත්කම විමර්ශනය කරයි.**

**4.** (i) කාර්මික නිෂ්පාදනයක් ලෙස යකඩ හා වානේ වැදගත්වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන රටවල් තුනෙහි යකඩ හා වානේ නිෂ්පාදනය කෙරෙන මධ්‍යස්ථාන **එක බැගින්** නම් කරන්න.

(a) ඉන්දියාව

(b) චීනය

(c) ඇමෙරිකා එක්සත් ජනපදය (ලකුණු 03 යි)

(iii) ලෝකයේ රටවල් අතර සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව වැදගත්වීමට හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(04)

I.

- කල් පැවැත්ම, ශක්තිය දරා සිටීමේ හැකියාව, නම්‍යශීලිබව කම්පනයට ඔරොත්තු දීමේ හැකියාව
- ඇතැම් කර්මාන්ත සඳහා අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍යයක් වීම.
- යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන කටයුතු සඳහා අත්‍යවශ්‍ය වීම
- කර්මාන්ත රැසකට පාදක මූලික ලෝහයක් වීම
- වෙනත් ලෝහ සමග මිශ්‍ර කිරීමට හැකි වීම (ඇලුමිනියම් / තඹ)
- රටක කාර්මික ශක්තිය, තීරණය කරන සාධකයක් වීම.
- ප්‍රයෝජනයට ගෙන ඉවත් කළ පසු ප්‍රතිචක්‍රීකරණය කිරීමේ හැකියාව

**මෙවැනි කරුණු දෙකක් සඳහන් කිරීමට**
**ලකුණු 1 + 1 = 02**

II.

(a) ඉන්දියාව

- බටහිර කාර්මික කලාපය
- නැගෙනහිර කාර්මික කලාපය
- දකුණු කාර්මික කලාපය

ඩැමෝඩාර්, බැංගලෝර් වැනි කාර්මික මධ්‍යස්ථාන නම්වලින් සඳහන් කර තිබේ නම් සැලකිල්ලට ගත යුතු ය.

(b) චීනය

- දකුණු මැංචූරියා ප්‍රදේශය
- බෙයිජිං ප්‍රදේශය
- ෂන්හුවාං ප්‍රදේශය

(c) ඇමරිකා එක්සත් ජනපදය

- මිචිගන් විල්බඩ ප්‍රදේශය
- පිට්ස්බර්ග් කලාපය

- ඩෙට්රොයිට් කලාපය
- නව එංගලන්ත ප්‍රදේශ
- දකුණු ඇපලාචියන් ප්‍රදේශ

**ඉහත (a), (b), (c) යටතේ එක් මධ්‍යස්ථානය බැගින් නම් කිරීමට**
**ලකුණු 1 + 3 = 03**

III

- විවිධ සංචාරක ආකර්ෂණ පැවතීම.
- සංචාරකයන් සඳහා වියදම් අඩු වීම.
- පෙර අපර දෙදිග සංචාරක මධ්‍යස්ථානයක් ලෙස වැදගත්කමක් ඉසිලීම.
- සංචාරකයන් සඳහා පහසුකම් තිබීම.
- ලාංකිකයන්ගේ සංග්‍රහශීලි බව
- ඈත අතීතයේ සිටම සංචාරක මධ්‍යස්ථානයක් ලෙෂ වැදගත්කමක් ඉසිලීම.
- කෙටි කාලයක් තුළ කෙටි දුරකින් විවිධ සංචාරක ආකර්ෂණ වෙත ළඟාවීමේ හැකියාව හිතකර සාධකයක් වීම.
- ශ්‍රී ලංකාව ඓතිහාසික උරුම, පාරිසරික උරුම, නව නිර්මික වැනි ස්පර්ෂ උරුම රාශියක් අත්පත් කර ගත් රටක් ලෙස ප්‍රසිද්ධ වී තිබීම.

**මෙවැනි හේතු තුනක් සඳහන් කිරීමට ලකුණු 1 x 3 = 03**
**එැහැදිලි කිරීමට ලකුණු 02**
**05**


**05. ඉගෙනුම් පල :**

**1. ලෝක ජනසංඛ්‍යා ව්‍යාප්තිය පිළිබඳ කරුණු ගවේෂණය කරයි.**

**2. ශ්‍රී ලංකාවේ අසම ධන ව්‍යාප්තියට බලපාන හේතු විමර්ශනය කරයි.**

5. (i) ලෝකයේ අධිකතම ජනසංඛ්‍යාවක් වාසය කරන රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත දක්වා ඇති සිතියම් කොටසෙහි ජනශූන්‍ය කලාප තුනක් Ⓐ, Ⓑ හා Ⓒ අනුවෙන් දක්වා ඇත.
ඒ එක් එක් කලාපය ජනශූන්‍ය වීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන හේතුව කුමක්දැයි ලියා දක්වන්න. (ලකුණු 03 යි)




(iii) ශ්‍රී ලංකාවේ අසම ධන ව්‍යාප්තියක් ඇතිවීමට ඉවහල් වී ඇති හේතු **තුනක්** සඳහන් කර ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(05)

I.

- ඉන්දියාව
- චීනය

ලකුණු **1 + 1 = 02**

II.

(A) කඳුකර භූ විෂමතාව පැවතීම

(B) කාන්තාර දේශගුණයක් පැවතීම

(C) නිවර්තන වර්ෂා වනාන්තර (ඝන වනාන්තර) ප්‍රදේශයක් වීම

ලකුණු (A)**1** + (B)**1** + (C)**1 = 03**

III.

- භෞතික සාධකවල සවභාවය (භූවිෂමතාව/දේශගුණය/ජල පහසුව/පස/වනාන්තර/ ස්වාභාවික සම්පත්)
- යටිතල පහසුකම්වල ස්වභාවය (යටිතල පහසුකම් වෙන වෙනම ලියා තිබේ නම් වෙනම කරුණු ලෙස සලකා ලකුණු දෙන්න නිද-අධ්‍යාපන/සෞඛ්‍යා ආදී)
- ආර්ථික කටයුතුවල ව්‍යාප්තිය
- වාණිජ හා පරිපාලන කටයුතුවල ව්‍යාප්තිය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- සංස්කෘතික හේතු
- නාගරිකරණය

**(මෙවැනි හේතු තුනක් සඳහන් කිරීමට ලකුණු 1 x 3 = 03**
**එක් හේතුවක් විස්තර කිරීමට ලකුණු 02**
**05**

**06. ඉගෙනුම් පල :**

**1. සම්පත් වර්ගීකරණය කරයි.**

**2. පාෂාණවල ප්‍රයෝජන විමර්ශනය කරයි.**

**3. වනජීවීන් මුහුණ දෙන ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් යෝජනා කරයි.**

6. (i) පහත (a) සහ (b) සඳහා ගැළපෙන ස්වාභාවික සම්පත් **එක බැගින්** නම් කරන්න.
   (a) ආයාසයෙන් ලබාගන්නා සම්පත්
   (b) නිරායාසයෙන් ලැබෙන සම්පත් (ලකුණු 02 යි)

   (ii) ආග්නේය පාෂාණවලින් ලබා ගත හැකි ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

   (iii) ශ්‍රී ලංකාවේ වන ජීවීන් මුහුණපාන ගැටලු **තුනක්** නම් කර ඒවා විසඳා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග **එකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(06)

I.

(a) ආයාසයෙන් ලබා ගන්නා සම්පත්

- ඛනිජ
- වාරි ජලය
- නළ ජලය
- රෝපිත වනාන්තර
- නිෂ්පාදිත වායු වර්ග
- පෝෂණය කරන ලද පස

(a) නිරායාසයෙන් ලැබෙන සම්පත්

- පස
- ජලය
- වාතය
- හිරු එළිය
- වනාන්තර හා වෘක්ෂලතා

**මින් එකක් බැගින් නම් කිරීම**
(a)**1** + (b)**1** = **ලකුණු 02**

II.

- ගොඩනැගිලි ඉදිරිකිරීම
- විසිතුරු භාණ්ඩ නිපදවීම
- විවිධ ඛනිජ වර්ග ලබා ගැනීම (ටින් 1 ක්‍රෝමියම් වැනි)
- බෑවුම් ප්‍රදේශ ආරක්ෂාවට යොදා ගැනීම
- මහා මාර්ග ඉදිකිරීම
- විවිධ නිර්මාණ සඳහා යොදා ගැනීම (ප්‍රතිමා වැනි)

**මෙවැනි ප්‍රයෝජන තුනක් සඳහන් කිරීම ලකුණු** 1 x **3 = 03**

III. ගැටළු

- ආහාර හා ජලය සොයා ගැනීමේ දුෂ්කරතාව
- දඩයක් කරුවන්ගෙන් සිදුවන හානි
- වන සතුන්ට එරෙහිව සිදුවන මිනිස් ක්‍රියාකාරකම්
- ස්වභාවික උපද්‍රවවලට ගොදුරු වීම
- සංවර්ධන කටයුතු නිසා ඇතිවන හිංසාකාරී බලපෑම්
- වාසභූමි අහිමි වීම
- වනාන්තරවලට කසල බැහැර කිරීම

**මෙවැනි ගැටළු තුනක් සඳහන් කිරීම**

**ගැටළු විසඳාගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් විස්තර කිරීම**

- වනමංපෙත් අවහිර නොකිරීම
- නියංකාලවලදී ආහාර හා ජල පහසුකම් සැපයීම
- අහිතකර මිනිස් ක්‍රියාකාරකම් නැවැත්වීම සඳහා නීති ක්‍රියාත්මක කිරීම
- සංවර්ධන කටයුතු නිසා ඇති වන බාධා අවම කිරීමට පියවර ගැනීම

**(මෙවැනි ක්‍රියාමාර්ගයක් විස්තර කිරීම ගැටළු තුන නම් කිරීමට ලකුණු** 1 x **3 = 03**
**විසඳා ගැනීමේ ක්‍රියාමාර්ගයට ලකුණු** 02
05

## 07. ඉගෙනුම් පල :

**1. සංවර්ධන මැනීම සඳහා භාවිත කරන මානුෂ සංවර්ධන දර්ශකයේ නිර්ණායක විස්තර කරයි.**

**2. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශ පැහැදිලි කරයි.**

**3. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය දායක වන ආකාරය විමර්ශනය කරයි.**

7. (i) මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉවහල්වන ආකාරය පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(a) අධ්‍යාපනය

(b) සෞඛ්‍යය

(c) බැංකු හා මූල්‍ය ගනුදෙනු (ලකුණු 05 යි)

(07)

I.

- උපතේදී ආයු අපේක්ෂාව
- සාක්ෂරතාව
- ක්‍රයශක්තිය හා ගැළපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය

**මින් දෙකක් නම් කිරීම ලකුණු 1 + 1 = 02**

II.

- ජනසවිය
- සමෘද්ධි
- දිවි නැගුම
- අස් වැසුම
- ඇගලුම් කම්හල්
- මග නැගුම
- එක ගමකට එක වැඩක්
- ග්‍රාමීය ජල විදුලි ව්‍යාපෘති
- ප්‍රජා මූලික ජල ව්‍යාපෘති
- ගැමි දිවිය
- ගම්පෙරළිය

**මෙවැනි වැඩ සටහන් තුනක් නම් කිරීම ලකුණු 1 x 3 = 03**

III.

(a) අධ්‍යාපනය

- මාර්ගගත ඉගැන්වීම්
- විවිධ ඉගැන්වීම් උපකරණ
- අන්තර්ජාල පහසුකම්
- විශාල පිරිසකට එකවර ඇමතීමේ පහසුකම්
- ලෝකය පිළිබඳ නවතම තොරතුරු දැන ගැනීමේ හැකියාව
- අතථ්‍ය විශ්ව විද්‍යාල (Virtual Campus)

- විද්‍යුත් තැපැල
- කෘතිම බුද්ධිය (A.I)

**මෙවැනි කරුණු ඇසුරින් නිදසුන් දක්වා පැහැදිලි කිරීම**

(b) සෞඛ්‍යය
- රෝග විනිශ්චය සඳහා නව උපකරණ හඳුන්වා දීම
- නවීන ශල්‍ය වෛද්‍ය උපකරණ
- දත්ත රැස්කිරීම, ගබඩා කිරීම හා හුවමාරු කර ගැනීම
- (E, Mediecine) අන්තර්ජාලය හරහා වෛද්‍ය සේවා ලබා ගැනීම

**මෙවැනි කරුණු ඇසුරින් නිදසුන් දක්වා පැහැදිලි කිරීම**

(c) බැංකු හා මුදල් ගණුදෙනු
- මුදල් ගණුදෙනු ඉක්මන් වීම - (මාර්ගගත මුදල් ගණුදෙනු)
- මුදල් භාවිතය අවම වීම - (E, Commerce)
- සුරක්ෂිතතාව තහවුරු වීම - (Credit card)
- මුදල් ගණුදෙනු පහසුවීම - (E, Banking)

**මෙවැනි කරුණු ඇසුරින් නිදසුන් දක්වා පැහැදිලි කිරීම**

**නිදසුන් දැක්වීමට ලකුණු 03**
**පැහැදිලි කිරීමට ලකුණු 02**
**05**

**08. ඉගෙනුම් පල :**

**1. ලෝකයේ ලැව්ගිනි බහුල ප්‍රදේශ නම් කරයි.**

**2. ලැව්ගිනි ඇතිවීමට බලපාන හේතු පරීක්ෂා කරයි.**

**3. දේශගුණික වෙනස්වීම් අවම කර ගැනීමට දායක විය හැකි ආකාරය විමර්ශනය කරයි.**

**8.** (i) ලෝකයේ ලැව්ගිනි බහුලව හටගන්නා රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ලැව්ගිනි හටගැනීමට බලපාන ස්වාභාවික හේතු **දෙකක්** ද මානුෂ හේතු **එකක්** ද වෙන් වෙන් ව ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) දේශගුණික වෙනස්කම් අවම කර ගැනීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(08)

I.
- ඕස්ට්‍රේලියාව
- කැනඩාව
- ඇමරිකා එක්සත් ජනපදය
- චීනය
- ඉන්දුනීසියාව
- මධ්‍යම අප්‍රිකානු රටවල්

**මින් රටවල් දෙකක් නම් කිරීම ලකුණු 1 + 1 = 02**

II.

(a)

- දැඩි නියඟ ශා වියළි සුළං
- ශාක කඳන් එකට ඇතිල්ලීම
- අකුණු සැර වැදීම
- ගිනි කඳු පිපිරීම

**මෙවැනි හේතු දෙකක් සඳහන් කිරීම**

(b)

- නොසැලකිල්ල මත සිදුවන ගිනි ගැනීම්
- ගිනි තැබීම

**මෙවැනි හේතුවක් සඳහන් කිරීම**

(a) **ලකුණු 02**
(b) **ලකුණු 01**
03

III.

- හරිතාගාර වායු වර්ග පිටකරන බලශක්ති ප්‍රභව අඩුවෙන් පරිභරණය කිරීම
- පුනර්ජනනීය බලශක්ති භාවිතය දිරි ගැන්වීම
- භෝග වගාව සඳහා රසායනික පොහොර වෙනුවට ඓන්ද්‍රීය පොහොර භාවිතය
- ඝන අපද්‍රව්‍ය කළමණාකරණය කිරීම
- වනවගා ව්‍යාප්තියට සහාය වීම හා රුක්රෝපනය
- පොදු ප්‍රවාහන සේවාවන් භාවිත කිරීම
- පරිභොජන රටාව සරල හා හානිකර නොවන ආකාරයෙන් පවත්වා ගැනීම

**මෙවැනි ක්‍රියාමාර්ග තුනක් නම් කිරීමට ලකුණු 03**

**එක් ක්‍රියාමාර්ගයක් පිළිබඳ විස්තර කිරීමට ලකුණු 02**
05